# විෂයමාලා ආවරණය සඳහා යෝජිත අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය
# පස්වන ශ්‍රේණිය (දෙවන වාරය)

## 2022

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී  අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

මේ වෙනුවෙන් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් ඇතුළත් ගොනුවක් මෙයට පෙර ඔබට ඉදිරිපත් කර ඇත. මෙහි අප විසින් යෝජනා කරනු ලබන්නේ දෙවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව දෙවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය.

## මව්බස - සිංහල
## පස්වන ශ්‍රේණිය ( දෙවන වාරය)

පස්වන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

පස්වන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පස්වන ශ්‍රේණියේ පළමුවන වාරයට අදාළ අකුරු සහ පිලි භාවිතයේ නිරවද්‍යතාව, වාක්‍ය අසා ලිවීම, වාක්‍ය නිර්මාණය කිරීම සහ ශබ්දනගා කියවීම මැන බැලීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුවාගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව පස්වන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

මව්බස විෂයයේ හයවන නිපුණතාවයේ සිට දහවන නිපුණතාවයේ මුල් කොටස් කිහිපයක් පමණක් ආවරණය කිරීම සඳහා යෝජිත ය. ඒ අනුව පහත යෝජනා කර ඇති විෂය අන්තර්ගත පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිදු කළ යුතු ය. ඊට අමතර ව හයවන නිපුණතාවයේ සවන් දීම සහ කතා කිරීමට අදාළ ක්‍රියාකාරකම් ද, හත්වන නිපුණතාවයේ පළමුවන ඉගෙනුම් පලයට අදාළ ක්‍රියාකාරකම් ද, අටවන නිපුණතාවයේ පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් ද, නවවන නිපුණතාවයේ පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් ද මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | R6<br>සන්නිවේදනය සඳහා කියවයි.<br><br>W6<br>සන්නිවේදනය සඳහා ලියයි. | ■ සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි. | • සුබ පැතුම් පත් | ක්‍රියාකාරකම 01 | 89, 90 | පැය 02 |
| | | ■ තොරතුරුවල සුවිශේෂතා කෙරෙහි අවධානය යොමු කර නිවැරදි ව වගු ගත කරයි. | • වගුගත කිරීම | ක්‍රියාකාරකම 02 | 91, 92 | පැය 01 |
| | | ■ පෞද්ගලික ලිපියක සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත් ව ලිපි ලියයි. | • පෞද්ගලික ලිපි | ක්‍රියාකාරකම 03 | 92-94 | පැය 03 |
| | | ■ ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු සුවිශේෂතා කෙරෙහි සැලකිලිමත් වෙයි. | • ආරාධනා පත්‍ර | ක්‍රියාකාරකම 04 | 95-97 | පැය 02 |
| | | ■ ආරාධනා පත්‍රයක් සකස් කර ඉදිරිපත් කරයි. | | | | |
| | | ■ ආකෘති පත්‍රයක් නිවැරදි ව සම්පූර්ණ කරයි. | • ආකෘති පත්‍ර | ක්‍රියාකාරකම 05 | 97-100 | පැය 01 |
| | | ■ යම් අදහසක් කාටූන් මගින් නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි. | • කාටූන් | ක්‍රියාකාරකම 06 | 100-102 | පැය 01 |

පස්වන ශ්‍රේණිය මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | L7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.<br><br>R7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.<br><br>W7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි. | ▪ සාහිත්‍ය සමිතියක වැඩසටහන් පෙළගැස්ම සකසයි.<br><br>▪ සාහිත්‍ය සමිතියක දී ඉදිරිපත් වීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>▪ සාහිත්‍ය සමිතියක් මෙහෙයවීමේ පරිචය ලබයි.<br><br>▪ මාතෘකාවකට අදාළ ව කරුණු රැස් කරයි.<br><br>▪ මාතෘකාවකට අදාළ ව වාක්‍ය ලියයි. | • සාහිත්‍ය සමිති<br><br>• මාතෘකාවකට අදාළ ව වාක්‍ය ලිවීම | ක්‍රියාකාරකම 02<br><br>ක්‍රියාකාරකම 03 | 105-108<br><br>108-113 | පැය.02<br><br>පැය.03 |

පස්වන ශ්‍රේණිය මව්බස (සිංහල

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • නිවැරදි උච්චාරණය සහිත ව කියවා පැහැදිලි ව පිටපත් කරයි. | L 8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි.<br><br>S 8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.<br><br>R 8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.<br><br>W 8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි. | • කියවීමේ පුරුදු වර්ධනය කර ගැනීම සඳහා පුස්තකාල භාවිතයට හුරුව ලබයි. | • පුස්තකාල භාවිතය | ක්‍රියාකාරකම 03 | 119 | පැය 02 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | L 9<br>අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන් දෙයි.<br><br>S 9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව කතා කරයි.<br><br>R 9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව කියවයි.<br><br>W 9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව ලියයි. | • තොරතුරු කියවා අන්තර්ගත සුවිශේෂ කරුණු උපුටා දක්වයි. | • තොරතුරු<br><br>• අන්තර්ජාලය | ක්‍රියාකාරකම 4<br><br>ක්‍රියාකාරකම 5 | 125-127<br><br>127 | පැය.02<br><br>පැය.02 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | S10<br>සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි. | • ප්‍රාණවාචී හෝ අප්‍රාණවාචී හෝ නාම පද යෙදෙන වාක්‍යයක ක්‍රියා පදය යෙදෙන ආකාරය සාකච්ඡා කරයි. | • ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීම | ක්‍රියාකාරකම 1 | 129 - 133 | පැය 03 |
| | | | • නාම පද | ක්‍රියාකාරකම 1 | 134 - 135<br>264 - 265 | පැය 03 |
| | L10<br>සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන් දෙයි. | | • ප්‍රාණවාචී නාම පද හා අප්‍රාණවාචී නාම පද | ක්‍රියාකාරකම 2 | 135 - 136<br>266 - 267 | පැය 03 |
| | R10<br>සම්මත භාෂා ව්‍යවහාර සඳහා කියවයි. | • ස්ත්‍රී ලිංග නාම පද හෝ පුරුෂ ලිංග නාම පද හෝ වාක්‍යයක භාවිත. වන ආකාරය විස්තර කරයි. | • ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද | ක්‍රියාකාරකම 3 | 136 - 138<br>268 - 269 | පැය 03 |
| | W10<br>සම්මත භාෂා ව්‍යවහාර සඳහා ලියයි. | • නාම පදයක ඒක වචන සහ බහු වචන භේදය ප්‍රකාශ කරයි. | • ඒක වචන හා බහු වචන නාම පද | ක්‍රියාකාරකම 4 | 138 - 140<br>269 - 270 | පැය 03 |
| | | | | | මුළු කාලය | පැය 36 |

## ගණිතය
## පස්වන ශ්‍රේණිය (දෙවන වාරය)

ගණිතය විෂයමාලාවේ පස්වන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කර ගෙන ඇති ද යන්න තහවුරු කර ගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය පෙළ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

ගණිතය විෂය සඳහා යෝජිත අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා පන්ති කාමරය තුළ අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් පසු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • මිනුම් ඒකක සහිත ව එකතු කිරීමේ ගැටලු විසඳයි. | • පරිමාව හා ධාරිතාව ඇතුළත් සරල ගැටලු විසඳයි. | • ලීටර සහ මිලිලීටර භාවිතයෙන් භාජනයකට අල්ලන ද්‍රව ප්‍රමාණය නිමානය කරයි. මැන සසඳයි.<br>• ලීටර සහ මිලිලීටර ඇතුළත් සරල එකතු කිරීමේ ගැටලු විසඳයි. | • භාජනවල ධාරිතාව නිමානය, මැනීම, සැසඳීම<br>• පරිමාව හා ධාරිතාව ආශ්‍රිත ගැටලු විසඳීම | පාඩම් 13 ක්‍රියාකාරකම 1, 2 සහ 4 | 68 සිට 73 | පැය 3 |
| • යම්කිසි බරක් නිමානය කර මැන නිමානය තහවුරු කර ගනියි. | • විවිධ වස්තුවල බර නිමානය කර මැන සසඳයි. ගැටලු විසඳයි. | • ද්‍රව්‍යයක බර ආසන්න කිලෝග්‍රෑමයට නිමානය කරයි. මැන සසඳයි.<br>• බර මැනීම සඳහා විවිධ තරාදි යොදා ගන්නා බව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ග්‍රෑම් සහ කිලෝග්‍රෑම් ඒකක ඇතුළත් ගෙනයාම සහිත සරල එකතු කිරීමේ ගැටලු විසඳයි. | • බර නිමානය, මැනීම සහ සැසඳීම<br>• විවිධ තරාදි හඳුනා ගැනීම<br>• ග්‍රෑම් සහ කිලෝග්‍රෑම් ඇතුළත් ගැටලු විසඳීම | පාඩම් 14 ක්‍රියාකාරකම 1 සිට 3 | 75 සිට 79 | පැය 3 |

## පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම ඇතුළත් සරල ගැටලු විසඳයි. | • ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම ඇතුළත් සරල ගැටලු විසඳයි. | • සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම ඇතුළත් සරල ගැටලු විසඳීම | පාඩම් 15 ක්‍රියාකාරකම 1 සිට 3 | 81 සිට 83 | පැය 3 |
| | • ඝන වස්තු හා ජ්‍යාමිතික හැඩතලවල ලක්ෂණ හා ස්වභාවය හඳුනා ගෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • ඝනකය, ඝනකාභය, සිලින්ඩරය හා චතුස්තලය යන ඝන වස්තුවල ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>• ද්විමාන හැඩතලවලින් ඝනකය, ඝනකාභය, සිලින්ඩරය සහ චතුස්තලය සාදයි.<br>• තිරස් හා සිරස් තල හඳුනා ගෙන දක්වයි. | • ඝන වස්තුවල ලක්ෂණ<br>• ඝන වස්තුවල ආකෘති නිර්මාණය<br>• සිරස් හා තිරස් තල | පාඩම් 16 ක්‍රියාකාරකම 1 සිට 5 | 84 සිට 91 | පැය 3 |
| • දත්තවලට අනුව තීර ප්‍රස්තාර අඳියි. | • දත්ත තීර ප්‍රස්තාර මගින් නිරූපණය කරයි. නිරූපිත තොරතුරු කියවයි. | • දත්ත රැස්කර තීර ප්‍රස්තාර මගින් නිරූපණය කරයි.<br>• තීර ප්‍රස්තාර මගින් නිරූපිත තොරතුරු විස්තර කරයි.<br>• දත්ත වැඩි සංඛ්‍යාවක් තීර ප්‍රස්තාර මගින් නිරූපණය කරයි. නිරූපිත තොරතුරු කියවයි. | • දත්ත රැස් කිරීම<br>• වගුගත කිරීම<br>• තීර ප්‍රස්තාරවල නිරූපණය කිරීම | පාඩම් 17 ක්‍රියාකාරකම 1 සිට 3 | 92 සිට 97 | පැය 3 |

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • දහයෙන් පංගු දශම සංඛ්‍යා ලෙස හඳුනා ගෙන භාවිත කරයි. | • දහයෙන් පංගු දශම සංඛ්‍යා ලෙස දක්වයි.<br>• එක් දශම ස්ථානයක් සහිත දශම සංඛ්‍යා දහයෙන් පංගු ලෙස දක්වයි. | • දහයෙන් පංගු සහ දශම සංඛ්‍යා | පාඩම 18 ක්‍රියාකාරකම 1 සහ 2 | 98 සිට 101 | පැය 2 |
| | • මීටර සහ සෙන්ටිමීටර ඇතුළත් ගණනය කිරීමේ සරල ගැටලු විසඳයි. | • මීටර සහ සෙන්ටිමීටර ඇතුළත් එකතු කිරීමේ සහ අඩු කිරීමේ ගැටලු විසඳයි.<br>• මීටර සහ සෙන්ටිමීටර ඇතුළත් සරල ගුණ කිරීමේ ගැටලු විසඳයි. | • ගැටලු විසඳීම | පාඩම් 19 ක්‍රියාකාරකම 1 සහ 2 | 102 සිට 105 | පැය 3 |
| | • බිල්පත් සකස් කරයි. | • ගුණ කිරීම හා බෙදීම අන්තර්ගත ව මුදල් ආශ්‍රිත සරල ගණනය කිරීම් කරයි.<br>• සරල ගනු දෙනු සඳහා බිල්පත් සකස් කරයි. | • සරල බිල්පත්<br>• මුදල් ආශ්‍රිත ගණනය කිරීම් | පාඩම් 20 ක්‍රියාකාරකම 1 සිට 3 | 107 සිට 111 | පැය 3 |

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • ඉලක්කම් තුනකට නොවැඩි සංඛ්‍යා 6න් සහ 7න් ගුණ කිරීමේ ගැටලු විසඳයි. | • 6 සහ 7හි ගුණන වගු ගොඩනගයි. මතකයෙන් කියයි.<br>• ඉලක්කම් දෙකකට නොවැඩි කවර හෝ සංඛ්‍යාවක් 6න් ගුණ කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>• ඉලක්කම් දෙකකට නොවැඩි කවර හෝ සංඛ්‍යාවක් 7න් ගුණ කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>• ඉලක්කම් තුනකට නොවැඩි සංඛ්‍යා 6න් සහ 7න් ගුණ කරයි. | • 6 සහ 7 ගුණන වගු<br>• 6 සහ 7න් ගුණ කිරීම් | පාඩම් 21 ක්‍රියාකාරකම 1 සිට 5 | 112 සිට 117 | පැය 5 |
| • කාල පරාසය පිළිබඳ මනෝමය ගැටලු විසඳයි. | • කාලය ගත වීම පිළිබඳ ගණනය කිරීම් සහිත ගැටලු විසඳයි. | • යම් කාර්යයක් ආරම්භ කළ වේලාව සහ අවසන් කළ වේලාව අනුව ඒ සඳහා ගත වූ කාලය ප්‍රකාශ කරයි.<br>• ආරම්භ කළ වේලාව සහ ගත වූ කාලය අනුව යම් කාර්යයක් අවසන් කළ වේලාව ගණනය කර ප්‍රකාශ කරයි.<br>• යම් කාර්යයකට ගත වූ කාලය සහ අවසන් කළ වේලාව අනුව ආරම්භක වේලාව ගණනය කර ප්‍රකාශ කරයි. | • කාලය ගත වීම ආශ්‍රිත ගණනය කිරීම් | පාඩම් 22 ක්‍රියාකාරකම 1 සිට 3 | 118 සිට 122 | පැය 3 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යා 6න් සහ 7න් බෙදීමේ සරල ගැටලු විසඳයි. | • ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවක් 6න් බෙදා ලැබෙන පිළිතුර ප්‍රකාශ කරයි.<br>• ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවක් 6න් බෙදීමේ සරල ගැටලු විසඳයි.<br>• ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවක් 7න් බෙදා ලැබෙන පිළිතුර ප්‍රකාශ කරයි.<br>• ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවක් 7න් බෙදීමේ සරල ගැටලු විසඳයි. | • 6 සහ 7න් බෙදීම<br>• ගැටලු විසඳීම | පාඩම් 23 ක්‍රියාකාරකම 1 සිට 4 | 123 සිට 126 | පැය 5 |
| | | | | | මුළු කාලය | පැය 36 |

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

**පස්වන ශ්‍රේණිය (දෙවන වාරය)**

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පස්වන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

මෙහි ඉදිරිපත් කර ඇති තේමා යටතේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

### පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • දේශිය ආහාරවල වැදගත්කම අගය කරමින් පරිභෝජනය කරයි. | අපේ ආහාර (6) | • ගුණාත්මක හා ඖෂධීය ගුණයෙන් යුත් ආහාර පාන වර්ග භාවිතයට යොමු වෙයි.<br>• ආහාර නාස්ති වන අයුරු හා ඒවා කල්තබා ගන්නා ආකාරය පිළිබඳ දැනුවත් බවෙන් යුතු ව කටයුතු කරයි.<br>• අනාරක්ෂිත ආහාර හේතුවෙන් වැළඳිය හැකි රෝගාබාධ පිළිබඳ අවබෝධයෙන් යුතු ව පවිත්‍රබවින් යුතු අහාර පරිභෝජනයට යොමු වෙයි.<br>• ආහාර ගැනීමේ සිරිත් විරිත් යහපුරුදු පිළිපදියි. | • වයසට සුදුසු පරිදි උස හා බර පවත්වා ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගෙන කටයුතු කරයි.<br>• අප ගන්නා ආහාර උචිත අයුරින් වර්ගීකරණය කරයි.<br>• පෝෂණ ගුණය ආරක්ෂා වන අයුරින් ආහාර පිළියෙල කිරීමට දායක වෙයි.<br>• ආහාර ප්‍රචාරණය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• ආහාර පවිත්‍රව තබා ගැනීමේ ක්‍රම අනුගමනය කරමින් ඒ අනුව කටයුතු කරයි. | 1<br>2<br>3-4<br>5<br>6 - 9 | 70 - 78 | පැය 10 |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ● තම ආරක්ෂාව හා පරික්සම පිළිබඳ ව සංවේදී ව හා අවස්ථෝචිත හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | ආරක්ෂාව හා පරිස්සම (7) | ● අනතුරු සිදු විය හැකි අයුරු පිළිබඳ දැනුවත් බවෙන් යුතු ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>● විවිධ භාණ්ඩ හා උපකරණ මෙන් ම, තාක්ෂණික මෙවලම් හා විවිධ ශක්තීන් භාවිතයෙන් ඇති විය හැකි හානි පිළිබඳ විමසිලිමත් බවින් යුතු ව කටයුතු කරයි.<br>● බෝවන හා බෝ නොවන රෝග වැළඳීම වළක්වා ගැනීම සඳහා සිදු කළ හැකි සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳ දැනුවත් බවින් යුතු ව කටයුතු කරයි. | ● ස්වභාවික හේතු නිසා සිදු විය හැකි අනතුරු හා එම අනතුරුවලින් සිදු විය හැකි හානි විස්තර කරයි.<br>● හදිසි අනතුරු සිදු විය හැකි අවස්ථා හා එවැනි අනතුරුවලින් ආරක්ෂා වන ආකාර ප්‍රකාශ කරයි.<br>● ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>● අනතුරක් සිදු වූ අස්ථාවක දී ලබා දිය යුතු ප්‍රථමාධාර පිළිබඳ අද්දැකීම් විස්තර කරයි.<br>● තමා මෙන් ම අන් අයට එරෙහි ව සිදු කරන සමාජ විරෝධී ක්‍රියාවලින් ආරක්ෂා වෙමින් විමසිලිමත් ව කටයුතු කරයි.<br>● විවිධ උපකරණ ආරක්ෂාකාරී ව භාවිත කරන ආකාර ප්‍රදර්ශනය කරයි.<br>● එදිනෙදා කාර්යයන් සඳහා විවිධ ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමේ දී ආරක්ෂාකාරී ව හා සැලකිලිමත් ව කටයුතු කරයි.<br>● තමා මෙන් ම අන් අය ද රෝගවලින් ආරක්ෂා කර ගැනීම සඳහා කළ හැකි දේ පැහැදිලි කරයි. | 1 - 8 | 81 - 87 | පැය 10 |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • තම පුරෝකතනය පිළිබඳ ව පරීක්ෂා කර බලා පුරෝකතනයේ සත්‍ය අසත්‍යබව ප්‍රකාශ කරයි.<br><br>• විවිධ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිත කර නවෝත්පාදනයේ යෙදෙයි. | ජලය (8) | • ජලය සමග විවිධ දේ ප්‍රතික්‍රියා කරන ආකාරය ගවේෂණය කරමින් වාර්තා කරයි.<br>• විවිධ අයුරින් සපයා ගන්නා ජලය කාර්යක්ෂම කළමනාකරණයකින් යුතු ව සුරක්ෂිත ලෙස පරිභෝජනයට ගනියි.<br>• ජලය හා බැඳුණු සාම්ප්‍රදායක සිරිත් විරිත් ගවේෂණශීලී ව පවත්වා ගැනීමට දායක වෙයි.<br>• ජලයෙන් විය හැකි අනතුරු හා හානි පිළිබඳ ව විමර්ශනය කර ඒවා අවම කර ගැනීමට දායක වෙයි. | • තාපයේ අඩු වැඩි වීම අනුව ජලයේ ඇති වන වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර වාර්තා කරයි.<br>• තමා අවට පරිසරයේ ජලය දූෂණය වී ඇති ආකාරය නිරීක්ෂණය කර එය වළක්වා ගත යුතු ආකාර පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි.<br>• ජලය හා බැඳුණු සිරිත් විරිත් ගවේෂණය කරයි.<br>• ගංවතුර අවස්ථාවක එම ජලය පරිහරණයෙන් ඇති විය හැකි ආපදා, අනතුරු පිළිබඳ තොරතුරු වාර්තා කරයි.<br>• එදිනෙදා පරිහරණය සඳහා අවශ්‍ය ජලය පිරිසිදු කර ගැනීමේ උපකරණ නිර්මාණය කරයි.<br>• ජලයේ සුන්දර තැන් ගැන කියවෙන කවි, ගීත තාලානුකූල ව ගායනා කරයි. | 1 - 7 සහ 9 | 89 - 97 | පැය 08 |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • සරල උපකරණ භාවිත කරමින් දෛනික අවශ්‍යතාවක් ඉටුකර ගනියි. | වැඩ පහසු කිරීමේ මං (9) | • වැඩ පහසු කර ගැනීම සඳහා වර්තමානයේ මෙන් ම අතීතයේ ද යොදා ගත් ශිල්පක්‍රම අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• වැඩ පහසු කර ගැනීමට ගුණාත්මක නිමාවක් සඳහා සැලසුම්ගත ව පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කිරීමට හුරු වෙයි.<br>• විදුලිය, චුම්බක සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගන්නා ආකාර විමර්ශනය කර වාර්තා කරයි.<br>• එදිනෙදා වැඩ පහසු කර ගැනීමට යොදා ගත හැකි විවිධ ශක්තීන් පිළිබඳ ව අත්හදා බැලීම් කරමින් වින්දනයක් ලබයි. | • සුමට ලෙස ද්‍රව්‍ය/භාණ්ඩ ස්පර්ශ වීමට සැලැස්වීමෙන් වැඩ පහසු කර ගන්නා ආකාරය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• වැඩ පහසු කර ගැනීමේ දී විදුලියෙන්, සුළඟින්, ගලා යන ජලයෙන් තල්ලු කිරීම, ඇදීම හා කැරකැවීම සිදු වන ආකාරය පිළිබඳ ව අත්හදා බලයි.<br>• සාමූහික කාර්යයන් ආරම්භයේ සිට අවසානය දක්වා ක්‍රියාකාරී ව පවත්වා ගනීම සඳහා දායක වෙයි.<br>• නිවසේ හා පාසලේ සරල යන්ත්‍ර භාවිත කරමින් වැඩ පහසු කර ගනියි.<br>• වැඩ පහසු කර ගැනීම සඳහා චුම්බක ශක්තිය යොදා ගත හැකි ආකාර නිර්මාණය කර අත්හදා බලයි. | 1 - 8 | 98 - 106 | පැය 10 |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • ඖෂධීය වටිනාකමක් ඇති ශාක හඳුනා ගෙන ඒවා රැකගැනීමට දායක වෙයි.<br>• ආත්මාභිමානයෙන් යුතු ව සාර්ථක වගාවක නියැළෙමින් ජාතික නිශ්පාදනයට දායක වෙයි. | ගෙවත්ත (10) | • සැලසුම් කරනු ලැබූ ගෙවත්තකින් එදිනෙදා තම නිවසට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවා ගැනීමට දායක වෙයි.<br>• ගෙවතු වගාවට පර්යේෂණාත්මක ව දායක වෙමින් වින්දනයක් ලබයි.<br>• බෝගවගාවන් ආරක්ෂා කර ගැනීමට යොදන උපක්‍රම පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.<br>• කෘෂි කර්මාන්තය හා බැඳුණු සංස්කෘතික වටිනාකම් අගය කරයි. | • තමා අවට පරිසරයේ වගාවන් ඇසුරෙන් වගාවට හිතකර අහිතකර සතුන් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>• බෝගවලට වැළඳෙන රෝගවලින් බෝග ආරක්ෂා කර ගැනීමට කළ හැකි දේ විමසා බලා වාර්තා කරයි.<br>• වගා කටයුතුවල දී අස්වැන්න නාස්ති වන අයුරු පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.<br>• අස්වැන්න ආරක්ෂා කිරීමට ගත හැකි පියවර යෝජනා කර ඒ අනුව ක්‍රියා කරයි.<br>• ගෙවතු වගාවට පර්යේෂණාත්මක ව දායක වෙමින් වින්දනයක් ලබයි.<br>• අතීතයේ ගෙවතු වගාව සඳහා යොදා ගත් සාම්ප්‍රදායික ක්‍රම ශිල්ප පිළිබඳ තොරතුරු වාර්තා කරයි. | 1 - 8 | 110 - 115 | පැය 08 |

## පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ගමනාගමනය (11) | • පාරේ ගමන් කරන්නන් විසින් පිළිපැදිය යුතු නීති රීති හා ආචාර ධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව මාර්ග ඵලදායී ව හා සුරක්ෂිත ව භාවිත කරයි.<br>• පොදු වාහනවලින් ඉටු කරන සේවා අගයමින් ඒවා සුරැකීමට දායක වෙයි.<br>• සේවාවක් කාර්යක්ෂම ව සිදු කර ගැනීම සඳහා විවිධ යාන්ත්‍රික ශක්තියෙන් යුතු වාහන යොදා ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි. | • මාර්ග භාවිත කිරීමේ දී හැසිරිය යුතු ආකාරය හා පිළිපැදිය යුතු නීති රීති පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>• මහමග ගමන් කිරීමේ දී හමු වන ආලෝක සංඥා පිළිබඳ ව අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• ශ්‍රී ලංකා සිතියමක් ඇසුරෙන් ගමනාගමනය සඳහා යොදා ගන්නා මාර්ග කිහිපයක් නිරීක්ෂණය කර ඒවා පැහැදිලි කරයි.<br>• පොදු වාහන ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කළ හැකි ආකාර අවබෝධයෙන් යුතු ව වාර්තා කරයි.<br>• ගමනාගමන කටයුතු සඳහා යාන්ත්‍රික ශක්තිය යොදා ගැනීමෙන් ගමනාගමන ක්‍රම සංවර්ධනය වූ අවස්ථා විස්තර කරයි.<br>• මාර්ග සංඥා පද්ධතියක ක්‍රියාකාරීත්වය විදහා දැක්වෙන නිර්මාණවල නියැළෙයි. | 1 - 6 | 120 - 127 | පැය 08 |
| | | | | | මුළු කාලය | පැය 54 |

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | පිටු අංකය | කාලය |
|---|---|---|---|---|
| සතියේ දින හත හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | திங்கட்கிழமை (திங்கள்)තිංගට් කිළමෛ (තිංගළ්)<br>செவ்வாய்க்கிழமை (செவ்வாய்) සෙව්වායික් කිළමෛ<br>புதன்கிழமை (புதன்) පුදන් කිළමෛ (පුදන්)<br>வியாழக்கிழமை (வியாழன்) වියාළක් කිළමෛ (වියාළන්)<br>வெள்ளிக்கிழமை (வெள்ளி) වෙල්ළික් කිළමෛ (වෙල්ළි)<br>சனிக்கிழமை (சனி) සනික් කිළමෛ (සනි)<br>ஞாயிற்றுக்கிழமை (ஞாயிறு) ඥායිට්ටෘක් කිළමෛ (ඥායිරු) | 1 | 230 | පැය 04 |
| පවුලේ සාමාජිකයන් හා ඥාතීන් සඳහා දෙමළ භාෂාවේ යෙදෙන නාමපද හඳුනා ගෙන සුදුසු ක්‍රියා පද යොදමින් භාවිත කරයි. | அம்மா අම්මා - අම්මා<br>அப்பா අප්පා - තාත්තා<br>தம்பி තම්බි - මල්ලි<br>தங்கை තංගෛ - නංගි<br>அண்ணா இருக்கிறார். අණ්ණා - අයියා<br>அக்கா ඉරුක්කිරාර් අක්කා - අක්කා<br>தாத்தா (ඉන්නවා) තාත්තා - සීයා<br>பாட்டி පාට්ටි - ආච්චි<br><br>அம்மாமார் අම්මාමාර් - අම්මලා<br>அப்பாமார் අප්පාමාර් - තාත්තලා<br>தம்பிமார் තම්බිමාර් - මල්ලිලා<br>தங்கைமார் තංගෛමාර් - නංගිලා<br>அண்ணாமார் இருக்கிறார்கள் අණ්ණාමාර් - අයියලා<br>அக்காமார் ඉරුක්කිරාර්හළ් අක්කාමාර් - අක්කලා<br>தாத்தாமார் (ඉන්නවා) තාත්තාමාර් - සීයලා<br>பாட்டிமார் පාට්ටිමාර් - ආච්චිලා | 1 | 231 - 233 | පැය 04 |

පස්වන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | පිටු අංකය | කාලය |
|---|---|---|---|---|
| එදිනෙදා විවිධ ස්ථානවල දී හා විවිධ අවස්ථාවල දී අන්‍යයන් සමග සුහද කතාබහේ යෙදෙයි. | සංවාදය 01<br>සංවාදය 02<br>සංවාදය 03<br>සංවාදය 04 | | 234-235 | පැය 04 |
| | | | මුළු කාලය | පැය 12 |

**සැ.යු.**

සියලු ආගම් විෂයයන්ට අදාළ විෂය අන්තර්ගත ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති කාලයම සුදුසු පරිදි සැලසුම් කර ගැනීමට යෝජිත ය.